00508

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

විද්‍යාවේදී/අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන

3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2019/2020

MSU3208/MCU1108 -ඔබගේ කාර්යය සහ සේවකයින් කළමනාකරණය

කාලය - පැය දෙක (02) යි.

---

දිනය - 2020.01.16 වන දින වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30 දක්වා

---

උපදෙස් :

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

01. (i) 'සන්නිවේදනය' (Communication) යන්නෙන් අදහස් වන්නේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) "සන්නිවේදනය යනු ක්‍රියාවලියකි." මෙම ප්‍රකාශයෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද යන්න කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 10)

(iii) සඵලදායි සන්නිවේදනය සඳහා බලපාන බාධක හතරක් (04) සාකච්ඡා කරන්න. ( ලකුණු 10)

02. "පාලනය යනු කලින් තීරණය කරන ලද ප්‍රමිතීන් ඉටුවන බැව් තහවුරු කර ගැනීම සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම පිණිස සංවිධාන කටයුතු මෙහෙයවීම හා වෙනස් කිරීමයි."

(i) පාලන ක්‍රියාවලියේ ප්‍රධාන අදියරයන් සාකච්ඡා කරන්න. ( ලකුණු 10)

(ii) පාලනයේ අහිතකර ප්‍රතිවිපාක සහ ඒවාට හේතු විය හැකි කරුණු මොනවා ද? ( ලකුණු 15)

03. (i) 'සංවිධානය' (Organization) යන පදය ඔබේ වචන භාවිතයෙන් නිර්වචනය කරන්න. ( ලකුණු 07)

(ii) සුදුසු උදාහරණ යොදා ගනිමින් කාර්යක්ෂමතාවය (Efficiency) සහ ඵලදායීතාවය (Productivity) අතර වෙනස දක්වන්න. ( ලකුණු 18)

04. (i) 'අභිප්‍රේරණය' (Motivation) යන්නෙන් අදහස් වන්නේ කුමක් ද යන්න පැහැදිළි කරන්න. ( ලකුණු 07)

(ii) අභිප්‍රේරණය සඳහා වන "හර්ස්බර්ග්ගේ ද්විත්ව සාධක න්‍යාය " (Herzberg's Two Factor Theory) කෙටියෙන් පැහැදිළි කර සංවිධානයක කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීම සඳහා එහි උපයෝගී බව සාකච්ඡා කරන්න. ( ලකුණු 18)

05. පහත සඳහන් මාතෘකා යටතේ කෙටි සටහන් ලියන්න.

(i) කළමනාකාරීත්ව භූමිකා (Managerial roles)

(ii) පූර්ණ තත්ව කළමනාකරණය (Total Quality Management)

(iii) නායකත්වය (Leadership)

(iv) සංවිධාන ව්‍යූහය (Organizational Structure)

(v) කාර්යය පරිසරය (Task environment)

( 5 x 5 = ලකුණු 25)

හිමිකම් ඇවිරිණි.